# යුවරාජවරණය

- **ආර්. ඒ. ජයවීර, ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරී**

පුද්ගලයෙකුගේ උප්පැන්න සහතිකයේ තිබෙන නමත් ඔහුගේ ගති පැවතුම් හා චර්යාවන් අතරත් බරපතළ නොගැලපීමක් තිබෙන්නට පුළුවන. උපතේදී ‘කුසල්හාමි’ නම ලැබූවෙකු අකුසල්ම කරන්නෙකු විය හැකිවාක් මෙනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අපේ රටේ නිල නාමය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයයි. ශ්‍රී ලංකාවේ නිල නාමයත් එහි ඇත්ත තත්ත්වයත් අතර බරපතළ නොගැලපීමක් දකින්නට පුළුවන. "ප්‍රජාතන්ත්‍රවාදී" යන්නට නොයෙකුත් අර්ථකථන තිබිය හැකිය. ඉතාමත් තීව්‍ර සමාජ ආර්ථික විෂමතාවක් තිබෙන රටක ඇත්තේ එක් පැත්තකට බර වූ ප්‍රජාතන්ත්‍රවාදයකි. ශ්‍රී ලංකාවේ තිබෙන්නේ අතළොස්සක් දෙනා සඳහා අතළොස්සක් දෙනා විසින් පවත්වාගෙන යන අතළොස්සක් දෙනාගේ ප්‍රජාතන්ත්‍රවාදයකි. ‘සමාජවාදී’ නාමය, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කළ අය හා ඊට කාලයක සිටම උරුමකම් පෑ අය විසින් අත්හැර දමා ඇත.

ඇතැම් පුද්ගලයින්ට අන්වර්ථ නාම පට බැඳ තිබේ. බොහෝ විට මෙවැනි නම් කෙනෙකුගේ ශරීර ලක්ෂණයකට, ක්‍රියාකාරිත්වයකට හෝ කරන ලද කිසියම් ක්‍රියාවකට සම්බන්ධය. නරියාට, ‘කපටි රජා’ යැයි කියති. ඇතැම් දොස්තරවරු ‘වන්ෂොට්’ කියා හඳුන්වති. අන්වර්ථ නාමය ඇසුන පමණින් කෙනෙකුට එම පුද්ගලයා ගැන යම් අදහසක් ඇතිකර ගත හැකිය. රූපයක් මවා ගත හැකිය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගැලපෙන්නේ කවර අන්වර්ථ නාමයක්ද? තත්කාලීන භූ-දේශපාලනයේ, ගෝලීය අර්ථ ක්‍රමයේ හා ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ අනුහස යටතේ අප මුහුණ පා සිටින තත්ත්වය පෙන්නුම් කරන ‘ශ්‍රී ලංකා නවවිජිතවාදී රාජ්‍යය’ යන්න ඊට සුදුසු බව පෙනේ. මේ යථා තත්වය නොදැන, නොදැක, නොපිළිගෙන අපට අර්බුදයෙන් ගොඩ එන්නට, ණය උගුලෙන් ගැලවෙන්නට, දිළිඳුකම තුරන් කරන්නට හෝ සංවර්ධිත රාජ්‍යයක් බවට පත්වන්නට නොහැකිය. ‘ප්‍රීතිමත් ජනතාවක්-සුව පහසු රටක්’ යන ඉලක්කය සපුරා ගත නොහැකිය.

## බ්‍රවුන්රිග්ගේ දෙවන ආක්‍රමණය

යටත් විජිත යුගයේ නිල අවසානය සනිටුහන් කළ 1948 දී, ඒක පුද්ගල ආදායම අතින් බලන විට අප අග්නිදිග ආසියාවේ දෙවන තැන සිටි බවත්, දෙවැනි වූයේ ජපානයට පමණක් බවත් ඇතැම්හු කියති. පාර්ලිමේන්තුවේදී ද වරක්, දෙවරක් නොව කීප වරක්ම කියා ඇත. මේ වූකලී මහා මිථ්‍යාවකි. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර 2024.09.04 දින ලංකාදීපයේ පළකළ ලිපියක ‘නිදහස ලබා ගන්නා විට ශ්‍රී ලංකාව ලෝකයේ අන්ත දිළිඳු රටවල් අතරින් එකක් වී’ යැයි කියා තිබේ. බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති යුගය 1948 දී අවසන් වූවාක් සේ පෙනුනද ශ්‍රී ලාංකික අනන්‍යතාව ගොඩනගා ගැනීමටත් සංවර්ධිත රාජ්‍යයක් බවට පත්වීමටත් අප සමත් වී නැත. අප ඒ තත්ත්වයට පත්වීමට පෙරම යළිත් විජිතවාදයට යටවීමට සිදුවිය. එය බ්‍රවුන්රිග්ගේ දෙවන උඩරට ආක්‍රමණයක් බඳුය. 1815 දී යටත් විජිතයක් වීමෙන් පසු සාමාන්‍ය ජනයා පාගා දමමින් උස්ව නැගී සිටි ප්‍රභූවරුන්

මෙන්ම අදත් සාමාන්‍ය ජනයා නොතකා හැර උස්ව නැගී සිටින ව්‍යාජ ප්‍රභූ (pseudo elite) පන්තියක් සිටී. **තවම පහළවීමේ සේයාවක් වත් නැත්තේ 21 වන සියවසේ කැප්පෙටිපොළ මහ නිලමේ ය.**

අවශ්‍යතාවන් (needs) සපුරා ගැනීමෙහි ලා ගෝලීය පරිමාණයේ අධි-මිල සුඛෝපභෝගී භාණ්ඩ-සේවා-ව්‍යාපෘති තෝරා ගැනීමේ උවමනාවන් (wants) ඇති කිරීමෙන් ද, ජනගහනයෙන් සැලකිය යුතු පිරිසක් ගෝලීය පුරවැසියන් බවට පත්කරවීමෙන් ද අපි අනුචිත (inappropriate) පරිභෝජනයකට නතුවී සිටිමු. **උවමනාවන් මවා පෑම කෙනෙකුට සිහිපත් කරවන්නේ "අපායට බියෙන් මත්පැන් නොබිව් මට - උපායෙන් පොවා යළි මා ගෙන සතුට" යනුවෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු නැව් නගිද්දී කියන ලදැයි පැවසෙන ජනකවි දෙපදය යි.** එදා කන්ද උඩරට ආක්‍රමණයට මග සැලසුවා වූ ද, රජතුමා පාවා දී ඔහුට නින්දා කළා වූ ද උඩරට ප්‍රභූවරුන් සමාන වන්නේ අද සිටින ව්‍යාජ ප්‍රභූවරුන්ට ය. කන්ද උඩරට අවසාන රාජ්‍ය බිඳවැටීම, අප නවවිජිතයක් බවට පත්වීමට අනුරූප වේ.

## මහා ආර්ථික අර්බුදය

**ප්‍රමාණවත් ජාතික ආදායමක් එක් රැස් කර ගන්නේ නැතුව ණයට සැප ගැනීමට යාමෙන්ද, ව්‍යාජ ප්‍රභූන්ගේ සීමාන්තික කෑදරකම සපුරා ගැනීමට ප්‍රාග්ධන වියදම් දෙතුන් ගුණයකින් පිම්බීමෙන් හා දූෂණ හා වංචාවන්හි යෙදීමෙන් ද උසුලාගත නොහැකි ණය බරකට රට යට කර දමා තිබේ.** 2022 හා 2023 වර්ෂවලදී ගෙවන ලද ණය පොලිය, පිළිවෙලින් රාජ්‍ය ආදායමින් සියයට 79.1% ක් හා 80.5% ක් තරම් ඉතා ඉහළය. මේ ණය ගැනීම නිසා අනාගත පරම්පරාවන්ට ක්‍රියා කිරීමට තිබෙන මූල්‍ය අවකාශය සීමා වී තිබේ. පසුගිය දිනක ශ්‍රී ලංකා මහ බැංකුවේ 74 වන සංවත්සරයේ දී මහාචාර්ය Lee C. Buchheit කළ දේශනයේදී පවසා ඇත්තාක් මෙන්, අනාගත පරම්පරාවන් තම ගෞරවනීය මුතුන් මිත්තන් ඔවුන්ට මේ අපරාධය කළේ ඇයි දැයි ප්‍රශ්න කළ විට, ඒ ගෞරවනීය මිතුන් මිත්තන්ට කීමට සිදුවන්නේ තමන්ගේ වාරයේදී කෑදරකම පාලනය කර ගැනීමට ඔවුන්ට නොහැකි වූ බවයි. (Daily Mirror – September 10, 2024).

**රටක් පාලනය නොකළ යුත්තේ කෙසේදැයි 2022 වන විට අපි මුළු ලෝකයටම උගන්වා ඇත්තෙමු.** දෙවන ලෝක මහා සංග්‍රාමය පැවති 1939-45 වකවානුවෙන් පසුව ඇති වූ ඉතාම අවාසනාවන්ත හා දුක්ඛිත තත්වයට අපේ රට ඇද වැටුනි. අප මුහුණදුන් අර්බුදය; විදේශ විනිමය අර්බුදය, රාජ්‍ය අය-වැය අර්බුදය, බැංකු ද්‍රවශීලතා අර්බුදය, ණය අර්බුදය, කෘෂිකාර්මික අර්බුදය, දේශපාලන හා ආණ්ඩුක්‍රම අර්බුදය යන අර්බුද ගණනාවක සංයුක්තයකි. මෙම අර්බුද එකිනෙක සමඟ දිගට හරහට ප්‍රතික්‍රියා කිරීමෙන් මහා ආර්ථික අර්බුදය හටගත්තේය.

ණය අර්බුදයෙන් ගැලවීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (අයි.එම්.එෆ්.) සරණ පැතීමට සිදුවී ඇත. මේ සරණ බන්ධනයෙන් හිතුවක්කාර ලෙස ගැලවෙන්නට නොහැකිය. කෙසේ හෝ මධ්‍ය කාලයේදී ඉන් ගැලවෙන්නට

වුවමනාය. එහෙත් ඒ සඳහා වන කිසිදු සැලැස්මක් අප ඉදිරියේ නැත. **අවුරුදු පහක් තුළ මේ අයි.එම්.එෆ්. කසාදය කටුගා දැම්මට පුළුවන.**

ඒ සඳහා කළ යුතු පළමු කාර්යය දේශීය නිෂ්පාදිතය වැඩි කිරීමයි. දේශීය පරිභෝජනය සඳහා දේශීය නිෂ්පාදිතය වැඩි කිරීමයි. එවිට රුපියල ශක්තිමත් වේ. විදේශ විනිමය අනුපාතය ආසන්න වශයෙන් ස්ථිර වේ. **සෙසු ලෝකය සමඟ කරන ගණුදෙනුවල ප්‍රතිඵලය (ගෙවුම් ශේෂය) වාසිදායක එකක් බවට පත්කර ගැනීමට දේශීය පරිභෝජනය සඳහා දේශීය නිෂ්පාදිතය වැඩි කර ගැනීම අවශ්‍යම වේ. එය සිදුවන්නේ කෙසේදැයි කෙනෙකු මවිතයට පත්වීමට පුළුවන.** ඒ සමගම සෙසු ලෝකය සමඟ කරන අපනයන ගණුදෙනු වැඩි කර ගැනීම අප ඉදිරියේ ඇති අභියෝගයයි. කලාපීය අපනයන කෙරෙහි අවධානය යොමු කිරීම, සේවා අපනයන වර්ධනය කිරීම, තරගකාරී මිලකට නිෂ්පාදනය කිරීම අපගේ අවධානය යොමු විය යුතු සමහරක් අංශයන්ය. කෙසේ වුවද අපනයන වැඩි කර ගැනීම ඉක්මනින්ම කළ හැකි දෙයක් නොවනු ඇත.

## දස ලක්ෂයක් ද්විත්ව පුරවැසියෝ

ද්විත්ව පුරවැසියන් ගැනත් ඔවුන්ට මන්ත්‍රී වරම් අහිමි කිරීම ගැනත් පසුගිය කාලයේ උණුසුම් සාකච්ඡා පැවැත්විණි. මෙහිදී සඳහන් වූයේ දෙතුන් දෙනෙකුගේ නම් ය. **එසේ වුවද දස ලක්ෂයක් ඉක්මවූ ද්විත්ව (නොහොත් ගෝලීය) පුරවැසියෝ ලංකාවේ සිටිති.** ඔවුන්ට වෙනත් රටක පදිංචි වීමේ පුරවැසිභාවය නොතිබෙන්නට පුළුවන. බොහෝ දෙනෙකුට උවමනා කරන්නේ පුරවැසිභාවය නොව පාරිභෝජන අවස්ථාවයි. අද බොහෝ දෙනාගේ හැසිරීම සැසඳෙන්නේ පුරවැසි නාමයට නොව පාරිභෝගික නාමයටයි. රට අවාසනාවන්ත තත්ත්වයකට පත්වීමේ එක හේතුවක් ද එයයි.

ලංකාවේ ඉහළම ආදායම් ලබන 5% කට පමණ විදේශ සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමට, විදේශ විශ්ව විද්‍යාලවලට හා වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලට තම දරුවන් ඇතුළත් කිරීමට හා විදේශයන්හි බැංකු ගිණුම් පවත්වාගෙන යාමට හැකිවී තිබීම ද්විත්ව හෝ ගෝලීය පුරවැසියෙකු වීමට සමාන නොවන්නේද? අප මේ තත්ත්වය සැසඳිය යුත්තේ ඈත ගම්මානවල, කොළඹට නොව තම පළාතේ අගනුවරටවත් නොගිය පාසල් සිසුන් සිටින තත්ත්වයත් සමගය. බෙහෙත් ගැනීමට පාන්දර සිට මිනිසුන් පෝලිම් ගැසී සිටින තත්ත්වයක් සමගය. මේ ඛේදනීය තත්ත්වය නවලිබරල්වාදී ආර්ථිකයේ අනිවාර්ය ප්‍රතිඵලයකි. ඉහළම මට්ටමේ සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් ලබාගැනීම පිණිස දියුණු රටකට යාම වෙනුවට අපේ රටේ එම සේවාවන් ඉහළ මට්ටමකට එසවීම අපේ අරමුණ විය යුතුයි. ඒත් සිදුවන්නේ ඇති-හැකි ගෝලීය පුරවැසියන් එම පහසුකම් බුක්ති විඳීමට දියුණු රටවලට යාමයි.

මේ සංසිද්ධිය සමඟ එකට කියවිය යුතු අනෙක් කරුණ වන්නේ ආදායම් හා ධනය බෙදීයාමේ විෂමතාවයි. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2019 ගෘහස්ථ ආදායම්-වියදම් සමීක්ෂණය අනුව ජනගහනයෙන් ඉහළම ආදායම් ලබන 20% ක් රටේ සමස්ත අදායමින් 51.3% ක් බුක්ති විඳිති. පහළම 20% ට ලැබෙන්නේ මුළු ආදායමෙන් 4.6% කි. විෂමතාවේ. බරපතළකම එළිදැක්වෙන තවත් මිනුමක් වන්නේ ජනගහනයෙන් 31% ක්

(මිලියන 7 ක් ) දුප්පත්කමේ නිල සීමාවටත් වඩා පහළ ආදායම් ලබන්නන් වීමය. **සමාජයේ මේ පහළ මට්ටමට හරිහැටි කෑමක්, ඇඳුමක්, නිවාසයක්, සෞඛ්‍ය පහසුකමක්, අධ්‍යාපනයක් හෝ සැනසීමක් ලැබෙන්නේ නැත.**

අසාර්ථක ආර්ථික සංවර්ධනය හේතුවෙන් හා ඉහත දැක්වූ අනෙකුත් කරුණු නිසා ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයකට නොයෙක් සහනාධාර දීමනා ගෙවීමට සිදුවී තිබේ. ජනසවිය, සමෘද්ධිය, අස්වැසුම යනුවෙන් කලින් කළ හඳුන්වනු ලැබූ **මේ සහනාධාර සැලකිය යුත්තේ ශුභසාධන දීමනා ලෙස නොව අසමත් රාජ්‍යයක් විසින් ජනගහනයේ ඇතැම් කොටස්වලට ගෙවන වන්දියක් ලෙසටය.** අයි.එම්.එෆ්. වැනි ජාත්‍යන්තර ආයතන සමග එළඹෙන ගිවිසුම් වලදීත් මේ වන්දි ගෙවීම (සහනාධාර) ගැන සඳහන් වේ. එයින් පෙනෙන්නේ මේ වන්දි ගෙවීම ගෝලීය ආර්ථිකයේ අනිවාර්ය අංගයක් බවට ඔවුන් විශ්වාස කරන බවය. දිළිඳු බව ඔවුන්ගේ න්‍යාය පත්‍රයේ ස්ථිර අයිතමයක් බවය.

කෙනෙකුට සංඛ්‍යා ලේඛන කිසිවක් නොබලා වටපිට බැලීමෙන් පමණක්ම පියවි ඇසින් ශ්‍රී ලාංකීය සමාජයේ මේ කණගාටුදායක තත්ත්වය බලාගත හැකිය. **මේ දුප්පතුන් සිටින්නේද "ශ්‍රී ලංකාව", "මහජනතාව", "අපේ රට" කියන කුඩය ඇතුළේමය. කලින් සඳහන් කළ ද්විත්ව (ගෝලීය) පුරවැසියන් සිටින්නේද එම කුඩය ඇතුලේමය.** රටෙහි තිබෙන්නා වූ ඉතාමත් තීව්‍ර ආදායම් හා ධන සංකේන්ද්‍රනයත් ඒ හා සමගාමීව පවතින බරපතළ ආදායම් විෂමතාවත් දියුණු බටහිර ලෝකයේ පැවැත්මට අවශ්‍ය සාධකයන්ය. දියුණු බටහිර ලෝකයේ නිෂ්පාදිත භාණ්ඩ හා සේවාවන්ට, දකුණේ පාරිභෝගික වෙළඳපොළ සැදෙන්නේ එවිටය. පැරැණි යටත්විජිතවාදය අද යුගයේ පවත්වාගෙන යන්නේ එලෙසය.

## නව විජිතවාදී අභියෝගය

ගෘහ ඒකකයන්ට ආදායම් ලැබෙන ප්‍රධාන මාර්ගය සේවා නියුක්තියයි. 2019 ගෘහ ආදායම් වියදම් සමීක්ෂණයට අනුව සේවා නියුක්තිකයින්ගෙන් 53% කට ලැබුනේ රුපියල් තිස්දාහකට අඩු මාසික ආදායමකි. මෙවැනි අඩු වැටුප් රාජ්‍යයක්, සංවර්ධිත රාජ්‍යයක් අසලකටවත් ගෙන යා නොහැකිය. අපගේ ආර්ථික සැලසුම් යොමු විය යුත්තේ මේ අඩු වැටුප් ඉහළට නංවන්නේ කෙසේද යන්නටයි. මෙහිදී ගැටලුවේ මුල-මැද-අග යන සෑම තැනකම අපට නව විජිතවාදී අභියෝගයට මුහුණ දෙන්නට සිදුවේ.

**විදේශ වෙළඳ ගණුදෙනුවලදී ජාත්‍යන්තර මුදල් ඒකකය ලෙස ඩොලරය යොදා ගැනීමත්, සංවර්ධන උපාය මාර්ගය ලෙස විදේශ ධනායෝජනයට පමණ ඉක්මවූ බර තැබීමත්, ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හරහා පවත්වාගෙන යන මූල්‍ය අධිකාරියත් අප දිගින් දිගටම නව වීජිතවාදයේ රඳවා ගැනීමට හේතුකාරක වී තිබේ.**

විදේශයන්හි රඳවා තබා ඇති අපනයන ආදායම් හා වෙනත් මගහැරීම් සැලකිල්ලට ගත් විට ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි) නිල ගණන් බැලීම වන ඩොලර් බිලියන 85 ට වඩා වැඩි බව පෙනෙනු ඇත.

එනිසා සැබෑ දේශීය නිෂ්පාදිතය සමඟ සැසඳූ විට අපේ ආදායම්/ද.දේ.නි. ප්‍රතිශතය දැන් ගණන් බලා ඇති (2022,7.3% ; 2023,9.8%) මට්ටමට වඩා බෙහෙවින් අඩු බව පෙනී යනවා ඇත. ප්‍රශ්නයේ නියම බරපතලකම පෙනෙන්නේ එවිටය. **බදු මගහැරීමත්, අඩු වැටුපත් ආර්ථිකයේ ප්‍රවර්ධනයට තිරිංග යෙදීමක් බවට පත්ව තිබේ.**

විදේශ ධනායෝජනය සංවර්ධන උපාය මාර්ගයේ අවශ්‍යම අංගයක් ලෙස සැලකීම තුළ ද අප ප්‍රපාතයේ තවත් පහළට වැටීමේ ඉඩකඩ වේගයෙන් වැඩිවී තිබේ. විදේශ ධනායෝජනයෙන් කොළඹ නගරයේ ඉදිකරන විශාල ගොඩනැගිලිවලට රුපියල්වලින් ගෙවන කුලිය හා විදේශ ධනායෝජනයෙන් ඉදිකරන සුළං හා සූර්ය විදුලි බලාගාර වල ලාභය රටින් පිටට ගෙන යාම සඳහා එම මූල්‍ය වත්කම් ඔවුහු ඩොලර් වලට හරවා ගනිති. එමතු නොව, **අපට පායන හිරුට විදේශීය ආයෝජකයෙකුට මුදල් ගෙවන අවාසනාවන්ත තත්ත්වයකට අපි පත්වන්නෙමු. මේවා අදෘශ්‍යමාන ආනයන ය.**

රට ඉදිරියේ තබා ඇති ජනාධිපති අපේක්ෂක යෝජනා හා වැඩසටහන් බොහෝ දුරට එකිනෙකට සමානය. ඒවායින් අපේ ගැටළුවේ මූලික හරය ආමන්ත්‍රණය කර නැත. තරඟයට මෙන් පොරොන්දු මාලා ඉදිරිපත් කර තිබේ. භූ දේශපාලනික අභියෝගයට මුහුණ දී නව විජිතවාදී ග්‍රහණයෙන් ගැලවෙන මගක් ඉදිරිපත් කර නැත. ස්වාධීන, ස්වෛරී රාජ්‍යයක් බවට පත්වන ආකාරය පෙන්වාදී නැත. එම නිසා ජනාධිපතිවරණයක දී අපට කළ හැක්කේ ගෝලීය අධිරාජ්‍යය තුළ ශ්‍රී ලංකාව පාලනය කිරීමට යුවරාජයකු තෝරා ගැනීම ය.

2024.09.12